කොළඹ දිසා අධිකරණයේ දී ය.

කොළඹ 10, ශ්‍රී විපුලසේන මාවතේ
අංක 167/4 දරණ ස්ථානයේ
නිහාල් ශ්‍රී අමරසේකර.

පැමිණිලිකරු.

| | | |
|---|---|---|
| නඩු අංකය | : | 19849/එම්.ආර් |
| ස්වභාවය | : | මුදල් අය කර ගැනීම |
| වටිනාකම | : | රු:300,000,000.00 |
| කාර්ය පටිපාටිය | : | සාමාන්‍ය |

- එරෙහිව -

කොළඹ 2, ස්ටේපල්ස් වීදියේ පිහිටි
"විසුම්පාය" යන ස්ථානයේ සහ
කොළඹ 5, කිරුළ පෙදෙසේ
අංක 37 දරණ ස්ථානයේ
ගාමිණී ලක්ෂ්මන් පීරිස්.

විත්තිකරු.

1997ක් වූ ජූලි මස 21 වැනි දින දී ය.

ද සිල්වා සහ පෙරේරා යන නාමය සහ විලාසම යටතේ නීති වෘත්තියේ නිරත ව සිටින, සිය නීතිඥ ජේ.ඩබ්ලිව්. ඩී. පෙරේරා මගින් පෙනී සිටින ඉහත නම සඳහන් පැමිණිලිකරුගේ පැමිණිලිපතේ පහත සඳහන් පරිදි ප්‍රකාශ කරයි:-

1. පැමිණිලිකරු සහ විත්තිකරු පදිංචි ව සිටින්නේත් මෙහි පහත දක්වා ඇති නඩු නිමිති පැන නැගුණේත් මෙම අධිකරණයේ බලසීමා ප්‍රදේශය ඇතුළත දී ය.

2. (අ) පැමිණිලිකරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර එහි පාලක සභාවේ සාමාජිකයෙකු ව සිට ඇත. තව ද ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමණාකරන ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේත් අධි සාමාජිකයෙකු වෙයි.

(ආ) පැමිණිලිකරු, ලෝක බැංකුවේ සහ යූඑස්ඒඩ් ආයතනයෙන් අරමුදල් සැපයෙන ශ්‍රී ලංකා රජයේ ආර්ථික යටිතල පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමේ ව්‍යාපෘති සම්බන්ධව පිළිවෙළින්, ප්‍රධාන උපදේශක සහ උපදේශක/ ජ්‍යෙෂ්ඨ ප්‍රතිපාර්ශ්වීය අධ්‍යක්ෂ වශයෙන් ද සේවය කර, මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙකු වශයෙන් සිට, උපදේශකයෙකු වශයෙන් වෘත්තියේ යෙදී සිටී..

3. විත්තිකරු ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ රෝඩ්ස් ශිෂ්‍යත්වධාරියෙකු වන අතර දර්ශණ විද්‍යාව පිළිබඳ ආචාර්යවරයෙකු වෙයි. තව ද, විත්තිකරු නීතිය පිළිබඳ මහාචාර්යවරයෙකු සහ කොළඹ විශ්ව විද්‍යාලයේ උපකුලපතිවරයා ලෙසද, වෙනත් දේ අතර, පසුගිය රජය යටතේ ජනසවිය භාර අරමුදලේ සභාපති ද, තරුණ කොමිෂන් සභාවේ සභාපති ද, නීති කොමිෂමේ, සුරැකුම්පත් සහ විනිමය කොමිෂමේ, ජාතික අධ්‍යාපන කොමිෂම යන ආයතනවල සාමාජිකයෙකුවද සිටිනු ලැබ ඇති අතර, ඔහු එම රජය සමග කිට්ටු සබඳතාවයක් තිබූ බවට දන ගන්නට ඇත. තව ද, ඔහු දැනට වෙනත් දේ අතර, වර්තමාන රජයේ නියෝජ්‍ය මුදල් ඇමති සහ අධිකරණ හා ව්‍යවස්ථා කටයුතු පිළිබඳ ඇමති වශයෙන් ද සේවය කරමින් සිටින, පාර්ලිමේන්තුවේ ජාතික ලැයිස්තුවේ මන්ත්‍රීවරයෙකු වෙයි.

4. (අ) පැමිණිලිකරු කොළඹ හිල්ටන් හෝටලය (හිල්ටන්) අයිති සමාගම වන හොටෙල් ඩෙවලොපර්ස් (ලංකා) ලිමිටඩ් සමාගමේ (එච්ඩීඇල්) කොටස් හිමිකරුවකු වෙයි.

(ආ) එච්ඩීඇල් සමාගමේ එවකට සිටි අධ්‍යක්‍ෂවරුන් කවර හෝ ක්‍රියා මාර්ගයක්වත් ගැනීමට අපොහොසත් ව පැහැර හැරි හෙයින් එවකට අධ්‍යක්‍ෂවරයෙකු වූ, කොටස් හිමිකරුවකුගේ ස්වරූපය දරමින්, පැමිණිලිකරු 1990 සැප්තැම්බර් මාසයේ දී එච්ඩීඇල් සමාගමේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සහ එම සමාගම වෙනුවෙන්, එකී එච්ඩීඇල් සමාගමේ අධ්‍යක්‍ෂවරුනුත් පාර්ශ්වයන් කරමින්, ඇතැම් ජපන් සමාගම්වලට විරුද්ධව කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ දරණ, ව්‍යුත්පන්න නඩුවක් පැවරුවේය.

(ඇ) එකී නඩුව සම්බන්ධයෙන්, දිසා අධිකරණය 1990 සැප්තැම්බර් මාසයේ දී වාරණ නියෝග නිකුත් කර, වෙනත් දේ අතර, පුද්ගලයින් ඔවුන් සමාජයේ ලැබූ බලය යොදා ගිවිසුම්වලට සහ සමාගමේ ප්‍රභාශ පත්‍රය සම්බන්ධ කටයුතු හරිහැටි ක්‍රියාත්මක කළේ ද යන කරුණු සම්බන්ධව ප්‍රශ්න නැගීම වලක්වන්නේද යනාදිය සහ ඒ පිළිබඳ වූ නිවැරදි පරීක්‍ෂණයක් වලක්වා මුදල් ගෙවීම් සිදු කිරීමට උත්සාහ දරනු ලබමින් සිටින අතර, මෙය ඇත්තවශයෙන් ම පැහැදිලි කරන තත්ත්වය නිවැරදි නම් වංක සහයෝගයෙන් ක්‍රියා කරන අවස්ථාවක් යනුවෙන් නිරීක්‍ෂණය කරමින් හිල්ටන් හෝටලය ඉදි කිරීම පිළිබඳව එකී ජපන් සමාගම්වලට ගෙවීම් කිරීම වලක්වාලමින් 1991 ඔක්තෝම්බර් මාසයේ දී අතුරු තහනම් නියෝග නිකුත් කරන ලදී.

5. (අ) එකී ජපන් සමාගම් එම නියෝගය සම්බනධයෙන් අභියාචනාධිකරණයට අභියාචනා ඉදිරිපත් කළ අතර, අතුරු තහනම් නියෝගයට විරෝධතා ඉදිරිපත් නොකර එච්ඩීඇල් සමාගමට විරුද්ධව වෙනම අතුරු තහනම් නියෝගයක් නිකුත් කරනු ලැබ තිබූ, දිසා අධිකරණයේ දී අතුරු තහනම් නියෝග පිළිබඳ විමසීමට සහභාගි නොවී, එම අභියාචනයේ දී එච්.ඩී.ඇල් සමාගම නියෝජනය කරමින් අතිරේක සොලිසිටර් ජෙනරාල්, එච්ඩීඇල් සමාගමේ අධ්‍යක්‍ෂ-විත්තිකාර වූ, පාර්ලිමේන්තු මන්ත්‍රී, කේ.ඇන්.චොක්සිගේ අධිනීතිඥ මහතා සමග එකී අභියාචනය තහවුරු කරමින් පෙනී සිටියේය.

(ආ) පැමිණිලිකරු විසින් ඉදි කිරීම් කටයුතු පිළිබඳ අඩුපාඩු සම්බන්ධ ප්‍රශ්න සහ පැහැදි ලි කිරීම් ඉල්ලා තිබියදීත්, තව ද ගොඩනැගිල්ල පිළිබඳව ස්වාධීන පරීක්‍ෂණයකට සහ ද්‍රව්‍යාත්මක හරි වැරදි බැලීමකටත් විරුද්ධත්වය ප්‍රකාශ කර තිබූ, එකී කේ.ඇන්. චොක්සි, 1990 පෙබරවාරි මස 28 දින ලියවිල්ල මගින් හිල්ටන් හෝටලය ඉදි කිරීම සම්බන්ධ ව එකී ජපන් සමාගම්වලට සම්පූර්ණ ගෙවීම් කිරීම කලින් අනුමත කර තිබුණි.

6. වෙනත් දේ අතර, විත්තියේ විත්තිවාචක සැලකිල්ලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වුවද, සාර්ථකත්වය පිළිබඳව වූ සාධාරණ සහ සත්‍ය අපේක්‍ෂාවන් පැමිණිලිකරුට ඇති අතර, බරපතල ප්‍රශ්නයක් සහ බැලූ බැල්මට පෙනෙන නඩුවක් තිබෙන බවත්, රජය බහුතර කොටස් හිමියා සහ ඇපකරු වශයෙන් එය රජයට සම්පූර්ණයෙන්ම නො සලකා හැරිය නො හැකි කරුණක් බවත්, අතුරු තහනම් නියෝගය ප්‍රදානය කරනු ලැබ ඇත්තේ සමාගමෙන් සහ රටින් මුදල් ,බැහැර කිරීමේ උපාය මාර්ග වැලක්වීම පිණිස බවත් නිරීක්‍ෂණය කරමින්, 1992 දෙසැම්බර් මාසයේ දී ශ්‍රේෂ්ඨාධිකරණය කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ නඩුවේ අතුරු තහනම් නියෝග නිකුත් කරමින් කළ නියෝගය පිළිගත්තේය.

7. (අ) කොළඹ දිසා අධිකරණයේ අංක 3155 / විශේෂ දරන පැමිණිලිකරුගේ නඩුව 1990 සැප්තැම්බර මාසයේ දී පැවරීමෙන් පසුව, රජය එච්ඩීඑල් සමාගමේ අධ්‍යෂවරුන් සංඛ්‍යාවේ එකොළොස් දෙනාගෙන් රජයේ නියෝජිත සංඛ්‍යාව හය දෙනෙක් දක්වා වැඩි කරමින්, 1990 සැප්තැම්බර් මාසයේ දී එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්‍ෂ මණ්ඩලය නැවත යංස්ථාපනය කළ අතර, පැමිණිලිකරු අධ්‍යක්‍ෂ ධූරයෙන් ඉවත් කරන ලදී.

(ආ) එකී කේ.එන්. චොක්සි ව්‍යවස්ථා කටයුතු පිළිබඳ ඇමතිවරයා වශයෙන් රාජකාරි භාර ගැනීමෙන් පසුව, 1993 ජූනි මාසයේ දී එච්.ඩී.එල්. සමාගමේ අධ්‍යක්ෂ වරයෙකු වශයෙන් සිටීමෙන් ඉල්ලා අස් වූ අතර, එකී පුරප්පාඩුව, 1993 ඔක්තෝබර් මස 15 වන දින සිට, එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයකු වශයෙන්, ජනාධිපති තිතිඥ ජේ. රොමේෂ් ද සිල්වා මහතා විසින් පුරවන ලදී.

(ඇ) 1993 අගෝස්තු මාසයේ දී රජය විසින් එච්ඩීඑල් සමාගමේ රජයේ අලුත් අධ්‍යක්ෂවරුන් හය දෙනා නැවත පත් කරන ලදී.

(ඇ) දිසා අධිකරණය විසින් නිකුත් කරනු ලැබූ තහනම් නියෝග තිබියදීත්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් එය ස්ථිර කරනු ලැබ සහ ඒ කාරණයට සම්බන්ධව පැමිණිලිකරු විසින් ලිඛිත කරුණු ගණනාවක් ඉදිරිපත් කරනු ලැබ තිබියදීත්, එච්ඩීඑල් සමාගමේ ඉහත සඳහන් කල අධ්‍යක්ෂවරු කවර හෝ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයක් නොගත්තෝය.

8. (අ) කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත පොදු සමාගමක් වන එච්ඩීඑල් සමාගමේ කටයුතු පිළිබඳ ක්‍රියාකලාපය සුරැකුම්පත් සහ විනිමය කොමිෂමේ සහ එම කොමිෂම විසින් ප්‍රසිද්ධ කොට ක්‍රියාවේ යොදනු ලබන රීතිවල සහ රෙගුලාසිවල විෂයපථයට යටත් විය.

(ආ) පැමිණිලිකරු, වෙනත් දේ අතර, 1992 අගෝස්තු 4 දිනැති ලිපියේ වඩාත් සම්පූර්ණ ලෙස දක්වා ඇති පරිදි ද, සුරැකුම්පත් හා විනිමය කොමිසමේ සහ කොළඹ කොටස් වෙළඳපොල රීති සහ රෙගුලාසි යටතේ, ඒවා උල්ලංඝණය කරන එච්ඩීඑල් සමාගමේ කටයුතු පිළිබඳ ක්‍රියාකලාපය සම්බන්ධව, සුරැකුම්පත් සහ විනිමය කොමිෂම සහ කොළඹ කොටස් වෙළඳපොළ වෙත ලිඛිත පැමිණිලි ගණනාවක් ම කළේය. කෙසේ වෙතත්, සුරැකුම්පත් සහ විනිමය කොමිෂම සහ කොළඹ කොටස් වෙළඳපොල කවර ක්‍රියා මාර්ගයක්වත් ගැනීමට අපොහොසත් විය.

(ඇ) විත්තිකරු අදාල කාලයේදී, එවකට තිබූ රජය විසින් පත් කරනු ලැබ, සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ ප්‍රධාන පෙළේ සාමාජිකයෙකුව සිටි අතර. එකී පැමිණිලි සම්බන්ධව ඔහුට විශේෂයෙන් දැනුම් දෙනු ලැබ තිබුණත් ඒවා සම්බන්ධව කවර හෝ ක්‍රියා මාර්ගයක් ගැනීමට අපොහොසත් ව පැහැර හැර ඇත.

(ඈ) පැමිණිලිකරු විසින් කරුණු නියෝජනය කරන ලදුව, විත්තිකරු එවකට සුරැකුම් පත් සහ විනිමය කොමිෂමේ සාමාජිකයෙකු වශයෙන්, පැමිණිලිකරුගේ නඩුවලට අදාල කරුණු ද ඇතුළුව, එච්ඩීඑල් සමාගමට අදාල කරුණු දැන ගෙන සිට ඇත. විත්තිකරු 1994 අගෝස්තු මස සිට නියෝජ්‍ය මුදල් ඇමති වශයෙන් සිටිනු ලැබ, මුදල් අමාත්‍යාංශයේ සිදු වූයේ මොනවාද යන්නත් දැන ගෙන සිටියේය.

9. (අ) ඉහත කී පසුබිම අනුව, 1992 වර්ෂයේ දී, එවකට මුදල් අමාත්‍යාංශයේ සිටි ලේකම්, ජපන් සමාගම්වල ඉල්ලීම පිට, ජපන් සමාගම්වලට ලැබිය යුතු මුදල් ඇතුළුව කරුණු ගණනාවක් මත සමථයකට එළඹීම සාකච්ඡා කිරීම පිණිස නීතිපති මගින් පැමිණිලිකරු සමග මැදිහත් වූ අතර, පටන් ගැනීමේ සිට එදින දක්වා සියලු පොලිය සහ එකී ජපන් සමාගම් විසින් හිමිකම් කියා සිටින ලද මුල් මුදලින් 30% ප්‍රමාණයක් කපා හැර දැමීමට ද, කලින් තිබූ වසරකට 6% පොලිය අඩුකොට වසරකට 5.9% බැගින්, ඉතිරි මුදල් වර්ෂ 2006 දක්වා නැවත උපලේඛණගත කරමින්, නීතිපති විසින් සමථ ගිවිසුම් 1993 ජූනි මාසයේදී සකස් කර අවසන් කරන ලදී.

(ආ) පැමිණිලිකරුගේ ඉහත කී අංක **3155**/විශේෂ දරන නඩුවෙන් රජයට සිදු වූ අතිවිශාල ප්‍රතිලාභ සැලකිල්ලට ගෙන, එච්ඩීඑල් සමාගම/හිල්ටන් හෝටලය සම්බන්ධ ප්‍රවර්ධන කටයුතුවලින් පැන නැගුණු සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් පැමිණිලිකරුව පටලවන ලද ඇතැම් නඩු පිළිබඳව සමථයක් ඇති කරවීමට රජය එකඟ වූයේය.

(ඇ) නීතිය පිළිබඳව වූ කරුණක් වශයෙන්, දිසා අධිකරණයේ සිට ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පූර්ණ විභාගයක් දක්වා එහි සියලු අවස්ථා සම්බන්ධව කොළඹ දිසා අධිකරණයේ අංක **3155**/විශේෂ දරන එකී ව්‍යුත්පන්න නඩුව පවරා පවත්වාගෙන යෑම සම්බන්ධව පැමිණිලිකරුට දරන්නට සිදු වූ නඩු ගාස්තු පිළිබඳ වියදම් ආපසු ගෙවීමකට පැමිණිලිකරුට හිමිකම ඇති බැවින් රජය එම වියදම් ආපසු ගෙවීමට එකඟ වූ අතර, එසේ දැරූ වියදම්, මුදල් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන සහ විමර්ෂණ අධ්‍යක්ෂ විසින් හරිවැරදි බැලීමෙන් විගනණය කරනු ලැබීමෙන් අනතුරුව, එම ගෙවීම පසුව කරන ලදී.

(ඈ) සමථ ගිවිසුම්වල තත් කාරණය සම්බන්ධයෙන් නිශ්චිත වගන්ති සැලසීම මගින්, රජය තමන් ම එකී ගිවිසුම්වලින් බැඳී සිටියේය. කෙසේ වෙතත් ප්‍රධාන වශයෙන්, පැමිණිලිකරුට පිළිගත නො හැකි කොන්දේසියක් වූ එච්ඩීඑල් සමාගමෙන් ලැබිය යුතු කපා හැර නො දමන ලද ඉතිරි මුදල් වෙනුවෙන් රජයෙන් පොරොන්දු නෝට්ටු ලබාගැනීමට එකී ජපන් සමාගම් විසින් තරයේ ඉල්ලා සිටීමේ හේතුව නිසා එකී සමථ ගිවිසුම් කටයුතු **1993** ජූනි මාසයේ දී අවසන් කළ නොහැකි විය.

10. නීතිපතිතුමා විසින් කටයුතු අවසන් කරන ලද සමථ ගිවිසුම්වල, වෙනත් දේ අතර, පහත සඳහන් කරුණු ද අඩංගු විය.

(අ) විත්තිකරු එක් සාමාජිකයෙකු ව සිටි සුරැකුම්පත් හා විනිමය කොමිෂමේ සහ කොළඹ කොටස් වෙළඳපොලේ සාමාජිකයින්ගේ, අකර්මණ්‍යත්වයට අදාළ ව පහත සඳහන් කොන්දේසිය:

> "එච්ඩීඑල් සමාගමට අදාල කාරණා මත එකී කොමිෂන් සභාවලට අමරසේකර මහතා විසින් කරන ලද නියෝජනයන් සම්බන්ධව එකී ආයතන වන ශ්‍රී ලංකාවේ සුරැකුම්පත් සහ විනිමය කොමිෂමේ සහ/හෝ එහි සාමාජිකයන්ගේ, තවද, කොළඹ කොටස් වෙළඳපොලේ සහ/හෝ එහි අධ්‍යක්ෂවරුන්ගේ ක්‍රියා කලාපය සහ ක්‍රියාමාර්ග සම්බන්ධව රජය විසින් යෝග්‍ය, ස්වාධීන ක්‍රියාමාර්ග ගත යුත්තේය සහ ගනු ලබන්නේය. තව ද එකී කාරණා ගැන තවදුරටත් ක්‍රියා කිරීමේ අයිතිය අමරසේකර මහතා විසින් තමා වෙතම රඳවා ගනු ලැබේ."

(ආ) එච්ඩීඑල් සමාගමේ **1990** මාර්තු මස **31** දිනට වූ වාර්ෂික ගිණුම් සහතික කරන ලද එච්ඩීඑල් සමාගමේ ගණන් පරීක්ෂකයින්ට අදාළ ව පහත සඳහන් කොන්දේසිය:

> '" මෙම සමථ ගිවිසුම සහ කොළඹ දිසා අධිකරණයේ අංක **3231**/විශේෂ නඩුව සමථයට පත්කිරීම හා ඉල්ලා අස්කර ගැනීම යන කාරණාවල සම්බන්ධතාව අනුව රජය විසින් එච්ඩීඑල් සමාගමේ වත්මන් විගණකවරුන් ඉවත් කොට වෙනත් විගණක ආයතනයක් ඒ වෙනුවට පත් කර **1990** මාර්තු මාසය අගට වූ වාර්ෂික ගිණුම් අවසන් කළ යුත්තේය, සහ අවසන් කරනු ලබන්නේය."

(ඈ) ලේඛණගත කල පොදු සමාගමක අධ්‍යක්ෂවරුන් වශයෙන්, නියමිත පරිදි, කවර හෝ ක්‍රියාමාර්ගයක් ගැනීමට අපොහොසත් වූ එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරුන්ට අදාල ව පහත සඳහන් කොන්දේසිය:

> "1992 දෙසැම්බර් මස 2වැනි දිනට සහ ඊට පසුව, 1994 සැප්තැම්බර් 30 දින දක්වා සහ / හෝ කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ දරන නඩුවේ විත්තිකරුවන් වී සිටිනු ලැබ ඇති, කෙසේ වෙතත්, මිට්සුයි සහ තායිසේයි සමාගම්වල වර්තමාන නාමිත අධ්‍යක්ෂවරුන් හැරුනු විට, එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරුන් ව සිටිනු ලැබ ඇති තැනැත්තන් බැහැර කිරීම පිණිස රජය විසින් එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය නැවත සංස්ථාපනය කල යුත්තේය සහ කරනු ලබන්නේ ය."

11.(අ) වර්තමාන රජය 1994 සැප්තැම්බර් මාසයේදී රාජ්‍ය කටයුතු භාර ගැනීමෙන් අනතුරුව, එවකට අග්‍රාමාත්‍යවරිය වූ, අතිගරු ජනාධිපතිනි, මුදල් අමාත්‍යවරියගේ ඉල්ලීම පිට එවකට සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් මුදල් අමාත්‍යාංශයේ උපදේශකයෙකු වන ලෙස පැමිණිලිකරුට ආරාධනය කර සිටින ලදී.

(ආ) මුදල් අමාත්‍යාංශයේ පැමිණිලිකරුට භාර දුන් නොයෙක් කාරණා අතර, එච්ඩීඑල්/හිල්ටන් හෝටලය පිළිබඳ විෂයය ද විය. තව ද, අනෙකුත් තැනැත්තන් අතර, පැමිණිලිකරු ද එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කරන ලදී.

(ඇ) ඉන්පසු, මුදල් අමාත්‍යවරයාගේ නියමයන් මත, සමථය සමාප්ත කිරීමේ අදහසින් 1993 ජූනි මාසයේ දී සකස් කර අවසන් කරනු ලැබ තිබූ සමථ ගිවිසුම්වල පදනම මත, එකී ජපන් සමාගම් සමග නීතිපතිවරයා ඉදිරියේ සාකච්ඡා පවත්වන ලෙසට පැමිණිලිකරුට, මුදල් අමාත්‍යාංශයේ ලේකම් විසින් උපදෙස් දෙන ලදී.

(ඈ) පැමිණිලිකරු විසින් සොලිසිටර් ජෙනරාල් ඉදිරියේ දී එවැනි වැඩිදුර සාකච්ඡා පවත්වනු ලැබ, එච්ඩීඑල් සමාගම එකඟ වූ ඉතිරි ලැබිය යුතු මුදල් වෙනුවෙන් පොරොන්දු නෝට්ටු රජයෙන් නොව, එච්ඩීඑල් සමාගමෙන් ලබා ගැනීමට එකී ජපන් සමාගම් ලිහිල් ස්ථාවරයක පිහිටා එකඟ වූහ.

(ඉ) ඊට අමතරව, පැමිණිලිකරු විසින් පවත්වන ලද සාකච්ඡාවල ප්‍රතිඵලයක් වශයෙන් තව අවුරුද්දක පොලිය ඵලදායී ලෙස කපා හැරීම සහ මුල් මුදලින් 30% ප්‍රමාණයක් කපා හැරීම ද අවුරුද්දක සහන කාලයක් සමග 2010 වර්ෂය දක්වා වසරකට 5.25% වන තවදුරටත් පහසු පොලී අනුපාතයක් ඇතිව, ඉතිරි මුදල් ආපසු ගෙවීම් නැවත උපලේඛණගත කිරීමත් සමග 1993 ජූනි මාසයේ දී සකස් කර අවසන් කල සමථ නියමයන් තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

(ඊ) ඉහත කී පරිදි එච්ඩීඑල් සමාගම විසින් පොරොන්දු නෝට්ටු නිකුත් කරනු ලැබීම සහ මූල්‍ය කොන්දේසි සම්බන්ධව තවදුරටත් වැඩිදියුණු කිරීම් කරනු ලැබීම යන කරුණු පමණක් හැරුණු විට, 1993 ජූනි මාසයේදී පැමිණිලිකරු සහ එවකට සිටි නීතිපති විසින් සකස් කර අවසන් කරන ලද සමථ ගිවිසුම් සොලිසිටර් ජනරාල් විසින් ඉඳුරාම පිළිගනු ලැබ, අනුමත කරන ලදී. තවද, සමථ ගිවිසුම රජය, එච්ඩීඑල් සමාගම, එකී ජපන් සමාගම් සහ පැමිණිලිකරු විසින් සහ ඔවුනොවුන් අතර 1995 ජූනි 28 දින ලියා අත්සන් තබන ලදී.

(උ) ඉහත 10 වැනි ඡේදයේ සඳහන් කර ඇති, සුරැකුම්පත් සහ විනිමය කොමිසමේ සහ කොළඹ කොටස් වෙළඳපොලේ සාමාජිකයින්ගේ අකර්මණ්‍යතාවට අදාල වූ ද, විත්තිකරුට පුද්ගලිකවම බල පාන්නා වූ ද කොන්දේසිය සහ එකී ඡේදයේ සඳහන් කර ඇති අනෙකුත් කොන්දේසි, 1995 ජූනි 28 දින ලියා අත්සන් කරන ලද එකී සමථ කොන්දේසිවල ක්‍රියාත්මක ව පවතින කොන්දේසි වශයෙන් දිගටම තිබුණේය.

12.(අ) 1994 මහ මැතිවරණය දක්වාම ගෙවී ගිය කාලය තුළ දී පොදුජන එක්සත් පෙරමුණ පැමිණිලිකරු විසින් පවරන ලද හිල්ටන් හෝටලය පිළිබඳ නඩුව, ස්වකීය මැතිවරණ වේදිකාවේ දී වංචාව හා දූෂණය පිළිබඳ වූ ප්‍රශ්නයක් බවට පෙරළාගෙන තිබුණු අතර ඒ බව විත්තිකරු විසින්ම 1995 අගෝස්තු 8 වන දින පාර්ලිමේන්තුවේ දී පිළි ගෙන ඇත.

(ආ) 1995 මාර්තු මාසයේ දී, අතිගරු ජනාධිපතිනිය, විසින් කොමිෂන් බලපත්‍රයේ උපලේඛණයේ ලැයිස්තු ගත කර තිබූ රාජ්‍ය ආයතනවල කටයුතු පරීක්‍ෂා කිරීම පිණිස වෙනත් දේ අතර, ඒවාට අදාලව බලය වැරදි ලෙස පාවිච්චි කිරීම හෝ අනිසි ලෙස යෙදීම, බලපෑම් කිරීම, මැදිහත් වීම්, වංචාව, දූෂණය සහ ඥාති සංග්‍රහ ආදී කරුණු විභාග කිරීමටද, විශේෂ ජනාපති පරීක්‍ෂණ කොමිෂන් සභාවක් පත් කරන ලදී. එකී උපලේඛණයේ ඇතුලත් කිරීම මගින් එච්ඩීඑල් සමාගමේ හිල්ටන් ව්‍යාපෘතියත් එහි සඳහන් කරන ලදී.

(ඇ) මූලික පරීක්‍ෂණ හා විමසීම් අවසන් කිරීමෙන් පසුව, විශේෂ ජනාධිපති කොමිසම 1995 දෙසැම්බර් මාසයේදී, එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්‍ෂවරුන් තිදෙනකු සහ තවත් අයෙක් බලය වැරදි ලෙස පාවිච්චි කිරීම හෝ අනිසි ලෙස භාවිතා කිරීම පිළිබඳව සහ/හෝ දූෂණය සහ/හෝ වංචනික ක්‍රියාවන් සිදු කිරීම පිළිබඳව ඔවුන් වරදකරුවන් නො කළ යුත්තේ මන්ද යනුවෙන් හේතු දක්වන ලෙස ඔවුන් වෙත චෝදනා කීපයක් දක්වමින් හේතු දැක්වීමේ නොතිසි නිකුත් කරන ලදී.

13.(අ) එච්ඩීඑල් සමාගමට, රජයට සහ රටට අතිවිශාල ලෙස අභිවෘද්ධිදායක වූ සමථයකට පැමිණීම පිණිස පැවැත්වූ කථාබහ සහ සාකච්ඡා සම්බන්ධයෙන් ඉහත කී පරිදි පැමිණිලිකරු විසින් ඉදුරාම ක්‍රියා කරන ලදී.

(ආ) 1995 ජූනි මස 28 දින සමාප්ත වූ සමථයේ ප්‍රතිඵල වූයේ එකතුව ජපානයෙන් මිලියන 17,586 (ශ්‍රී ලංකා රු.මිලියන 10,200) මුදලක් කපා හැරීමක් කරමින් පොලිය වශයෙන් ජපාන යෙන් මිලියන 13,476 (ශ්‍රී ලංකා රු. මිලියන 7,816) මුදලක් සහ, මුල් මුදලින් 30% වශයෙන් ජපාන යෙන් මිලියන 4,110 (ශ්‍රී ලංකා රු. මිලියන 2,384) මුදලක් කපා හැර දැමීමය.

(ඇ) එකී මුළු කපා හැරීම, එකී ජපන් සමාගම් විසින් ඉල්ලා සිටින ලද 1995 ජූනි මාසය දක්වා දණ්ඩන පොලිය ඇතුලත් වූ, ජපාන යෙන් මිලියන 27,793 (ශ්‍රී ලංකා රු.මිලියන 16,120) ක් වූ මුළු මුදලින් 63.3%ක් වූ අතර, එය ඒ දණ්ඩන පොලිය බැහැර කළ විට 55.4%ක කපා හැරීමක් විය.

(ඇ) එකී අතුරු තහනම් නියෝගවල ප්‍රතිඵලයක් වශයෙන් පොලියත් සමග එච්ඩීඑල් සමාගම අතේ එකතු වී තිබූ ජපාන යෙන් මිලියන 2,312 (ශ්‍රී ලංකා රු. මිලියන 1,341) වන මුදලක් ඉතිරි කපා නො හරින ලද මුල් මුදලින් අඩු කරන ලද අතර, ඉල්ලා සිටි මුළු මුල් මුදලේ 28.2% ප්‍රමාණයක මුදල වන ජපාන යෙන් මිලියන 7,834 (ශ්‍රී ලංකා රු.මිලියන 4,544)ක් වූ ඉතිරි මුදල වසරකට 5.25% වන අඩු පොලී අනුපාතිකයක් මත (කලින් 1999 වර්ෂය වන විට සම්පූර්ණයෙන් ගෙවීමට තිබූ) වර්ෂ 2010 දක්වා අවුරුදු 15ක කාලසීමාවක් ඇතුලත. වසරක සහන කාලයක් සහිත ව ගෙවීමට නැවත උපලේඛණ ගත කරන ලදී.

(ඉ) එකී මහා පරිමාණයේ කපා හැරීම් සහ සමථ කොන්දේසි එච්ඩීඑල් සමාගමට, රජයට සහ රටට ඇති විශාල අර්ථදායික වූ අතර, ඒවා මහජන සිතුවිලිවලට විෂය වූ කාරණයක් වන, අවුරුදු හයකට අධික කාලයක් මුළුල්ලේ පැමිණිලිකරුගේ තනි සහ නො නැවතී පවත්වාගෙන ගිය උත්සායන්ගෙන් මුදුන් පමුණුවා ගන්නා ලද ප්‍රතිඵල වේ.

14. (අ) එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයන් විසින් 1990 සිට 1994 දක්වා වූ අදාල කාලය තුළ දී, අධ්‍යක්ෂ මණ්ඩලය හමුවෙහි හෙළිදරව් කරන ලද කරුණු අරභයා හෝ එසේත් නැතිනම් 1991 දී අතුරු ඉන්ජන්ෂන් තහනම් නියෝග සහ 1992 දී ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව නිකුත් කිරීමට කලින් හෝ ඊට පසුව, සුදුසු ක්‍රියා මාර්ගයක් ගෙන තිබුනේ නම්,

(ආ) ඊට කලින් හෙළිදරව් කරන ලද හෝ දැන ගෙන සිටියා වූ කරුණු යටතේ 1990 නොවැම්බරයේ දී එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් සම්බන්ධයෙන් එච්ඩීඑල් සමාගමේ විගණකවරුන් විසින් ඔවුන් කළයුතු ව තිබූ පරිදි පිළිනොගෙන එම ගිණුම් සහතික කිරීමෙන් වැලකී සිටියේ නම්,

(ඇ) විත්තිකරු සහ සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සිටි ඔහුගේ අතිකුත් සමාගම් සාමාජිකයන් වෙත 1991 තරම් ඈත කාලයක දී පැමිණිලි කරනු ලැබූ අවස්ථාවේ දී ඔවුන් විසින්, අදාළ සහ නිසි ව්‍යවස්ථාපිත විධිවිධාන යටතේ නිසි සුදුසු හා කාලෝචිත ක්‍රියා මාර්ගයක් ඒ පැමිණිලි සම්බන්ධයෙන් ගත්තේ නම්,

(ඈ) ප්‍රධාන කොටස් හිමියා සහ ඇපකරු ලෙස රජය විසින්, එවකට පෙන්නා දෙන ලද/හෙළිදරව් කරන ලද කරුණු සම්බන්ධයෙන් ක්ෂණික හා බලාන්විත ක්‍රියා මාර්ගයක් ගත්තේ නම්,

අවුරුදු ගණනාවක් තිස්සේ වියදම් දරමින් පැමිණිලිකරු විසින් ගන්නා ලද එකී අඛණ්ඩ උත්සාහයන් අවශ්‍ය නොවිය යුතු ව තිබිණ.

15.(අ) එකී සමථ ගිවිසුම් 1995 ජූනි 28 වන දින ලියා අත්සන් කරන ලද අතර, විත්තිකරු එකී සමථය මාධ්‍ය මගින් මහජනතාව වෙත ප්‍රකාශයට පත් කිරීම පිණිස මුදල් අමාත්‍යාංශයේ දී 1995 ජූනි 30 වන දින පුවත්පත් සාකච්ඡාවක් කැඳවා, එවැනි ප්‍රසිද්ධ සාකච්ඡාවක් පැවැත්වීම සඳහා කටයුතු පිළියෙල කරන ලදී. එකී සමථය ගැන ක්‍රියා කරන ලද්දේ සහ එහි කටයුතු නිසි ලෙස අවසන් කරන ලද්දේ පැමිණිලිකරු විසින් බව විත්තිකරු දැන ගෙන සිටි බැවින්, පැමිණිලිකරුට එකී සාකච්ඡාවලට පැමිණ සිටින ලෙස ඉල්ලා සිටින ලදී.

(ආ) විදේශ කටයුතු අමාත්‍යවරයාට, සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයාට, ජපාන් තානාපතිවරයාට සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම් පැමිණෙන ලෙස විත්තිකරු විසින් ආරාධනය කරනු ලැබූ සහ එලෙස කැඳවනු ලැබූ එකී පුවත්පත් සාකච්ඡාවේ දී විත්තිකරු විසින් මුලසුන හොබවන ලදී.

(ඇ) පුවත්පත් විසින් සහ විද්‍යුත් මාධ්‍යය විසින් ද ආවරණය කරන ලද එකී ප්‍රසිද්ධ සාකච්ඡාවේ දී සමථය සඳහා කීර්තිය හිමි කර ගනිමින් දැඩි චිත්ත ප්‍රමෝදයෙන් විත්තිකරු මහජනතාව වෙත ප්‍රකාශ කර සිටියේ, *"අද අපට ඉමහත් සතුටට හේතු වන දවසකි, හිල්ටන් හෝටලය පිළිබඳ ආරාවුල සම්බන්ධයෙන් අපි සමථයකට එළඹ සිටිමු"* යනුවෙනි.

(ඈ) එකී ප්‍රසිද්ධ සාකච්ඡාවේ දී එකී සමථයට එළඹීම පිළිබඳ කටයුතු කරන ලද්දේ පැමිණිලිකරු විසින් වන නිසා එහි විස්තර පැමිණිලිකරු හොඳින් දන්නා බව විත්තිකරු විසින් ප්‍රකාශ කර සිටිමින් කිසියම් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් ඒ පිළිබඳ පැමිණිලිකරුගෙන් විමසා සිටින ලෙස මාධ්‍යකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. ඒ අනුව මාධ්‍යකරුවන් විසින් නගන ලද ප්‍රශ්නවලට පැමිණිලිකරු විසින් පිළිතුරු දෙන ලදී.

16.(අ) 1995 ජූලි 1වන දින "ද අයිලන්ඩ්" පත්‍රයේ වාර්තා කර තිබූ පරිදි එකී 1995 ජූනි 30 දින ප්‍රසිද්ධ සාකච්ඡාවේදී, පෙත්සම්කරු, සමථයේ කොන්දේසි විග්‍රහ කරමින් සහ ඉතිරි කර ගත හැකි මුළු මුදල වන රු. මිලියන 10,200 මුදල සහ රජයේ ආර්ථික සංවර්ධන වැඩ සටහන අතර, සමාන්තරයක් විදහා දක්වමින්, මෙසේ කියා සිටියේය. *"මෙම ඉතුරුව, රු. මිලියන 5000ක් පමණ වූ වාර්ෂිකව පාන් සඳහා දෙනු ලබන සහනය මෙන් දෙගුණයකි, (රු. මිලියන 9100ක් පමණ වූ) මුළු සමෘද්ධි වැඩ සටහන උදෙසා වැය කෙරෙන වාර්ෂික වියදමට සමානය, ඇතැම් පෙදෙස්වල ගොවීන්ගේ ගොවි ණය නිදහස් කිරීමෙන් ඔවුනට සලසා දෙන රු. මිලියන 1800ක් පමණ වූ වාර්ෂික සහනය මෙන් පස් ගුණයකටත් වැඩි මුදලකි, එමෙන් ම රු. මිලියන 1500ක් පමණ වූ ජාතික ගුරු සේවයේ වාර්ෂික අයවැය මෙන් හය ගුණයකටත් වැඩි මුදලකි."*

(ආ) එහිදී පෙත්සම්කරු තවදුරටත් මෙසේ කියා සිටියේය,: *"ජපන් කොන්ත්‍රාත්කරුවන් සමග අත්සන් කරන ලද සමථය, ජාතික සම්පත් පැහැර ගැනීම සහ මංකොල්ලකෑම වැලැක්වීම පිණිසත් විශාල පරිමාණයේ ඉතිරි කර ගැනීම උදෙසාත් රජයේ කැපවීම පිළිබිඹු කෙරෙන පොදු පෙරමුණු රජයේ මැතිවරණ ප්‍රකාශයේ ප්‍රධාන අංගෝපාංගවලට සෑම අතින්ම අනුකූල වේ. කෙසේ වෙතත්, මේ සමථය අල්ලස් හා දූෂණය පිළිබඳ විශේෂ ජනාධිපති කොමිෂම විසින් වරදකරුවන්ට විරුද්ධව ගනු ලැබිය හැකි දණ්ඩකාරක නෛතික ක්‍රියාමාර්ගය හා කිසියේත් කවරාකාර වූ හෝ ගැටීමක් ඇති කරන්නක් නොවේ."*

(ඇ) පෙත්සම්කරු තවදුරටත් මෙසේ කියා සිටියේය:, *"දිගින්දිගටම පැවති පීඩාවක් වූ ආරාවුල සම්බන්ධයෙන් සමථ ගිවිසුම අත්සන් කිරීමට යෙදුණු අද දින ජපන් රජයටත් ශ්‍රී ලංකා රජයටත් ඉතාමත් ප්‍රීතිමත් දිනයකි. එය අත්‍යාකාරයෙන් සිදු වූයේ නම්, ශ්‍රී ලංකාව සහ ජපානය විසින් අවුරුදු ගණනාවයක් තිස්සේ බුක්ති විඳිනු ලැබූ ඔවුනොවුන් අතර වූ යහපත් සහ බලවත් සබඳතා පලුදු වීමට ඉඩ තිබුණි. මිට්සුයි සහ තායිසේ නමැති ජපන් සමාගම් දෙකේ හොඳ නම ද අප විසින් සුරකින ලදී. තවද, මේ සමථය ඇති කර ගැනීමට අපට හැකි වූයේ ශ්‍රී ලංකාවේ සිටින ජපන් තානාපති යසුමි තාගුචි සහ ඔහුගේ පූර්වගාමියා වූ මසාකි කුනියාසුගේ නොපසුබට උත්සාහය හේතුවෙනි. ".*

(ඈ) 1995 ජූලි 1වන දින දිනමිණ පත්‍රයේ වෙනත් දේ අතර වාර්තා කර තිබුනේ මෙම සමථයට එළඹීම සඳහා ජපනුන් සමග සාකච්ඡා පැවැත්වූ බවත්, සමථ ගිවිසුම් නීතිපතිවරයා විසින් සමාප්ත කළ බවත් පෙත්සම්කරු විසින් පවසන ලද බවය.

(ඉ) නියෝජ්‍ය මුදල් ඇමතිවරයා වශයෙන් පෙත්සම්කරු මෙම නඩුවට වැදගත් වන සියලු කාලවලදී, ඉහත කී සමථයට එළඹීමට හැකි වූයේ තනිකරම පැමිණිලිකරුගේ උත්සාහයන් හේතුකොටගෙන බව සම්පූර්ණයෙන්ම දන සිටියේය.

*එකී ප්‍රවෘත්තිපත්‍ර වාර්තා පිළිවෙළින් ඒ1(ඒ) සහ ඒ1(බී) වශයෙන් ලකුණු කොට මෙයට අමුණා ඇති අතර ඒවා මෙහි ම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.*

17.(අ) එකී ප්‍රසිද්ධ සාකච්ඡාවට සති තුනකට පමණ පසු අපූර්ව ක්ෂණික පෙරළියකින් පෙත්සම්කරු පදනම් විරහිත විරුද්ධත්වයක් හදිසියේම ගෙන හැර පාමින් කවරාකාර වූ හෝ නෛතික පදනමක් නොමැතිව, ආණ්ඩුව, එච්ඩීඑල් සමාගම, එකී ජපන් සමාගම් සහ පැමිණිලිකරු විසින් සහ ඔවුනොවුන් අතරෙහි නීත්‍යනුකූලව හා ගිවිසුම්මය වශයෙන් ලියා අත්සන් කරන ලද සමථ ගිවිසුම් සම්පූර්ණයෙන්ම අත්හිටවූයේ ය..

(ආ) තවද, එකී සමථ ගිවිසුම්, විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හිල්ටන් හෝටලය පිළිබඳ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් තීරණයක් කරන තෙක් ක්‍රියාත්මක නොකරන බව දන්වා සිටිමින් එකී ජපන් සමාගම වෙත 1995 ජූලි 24 වන දින දරන ලිපි යවන ලෙස විත්තිකරු විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කර ඇත.

*1995 ජූලි 24 දින සහිත එකී ලිපිවල සත්‍ය පිටපත් "ඒ2ඒ" සහ "ඒ2බී" යනුවෙන් ලකුණු කොට මෙයට අමුනා ඇති ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.*

(ඇ) එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටවීමට යෙදුනු බව විත්තිකරු විසින් එදිනම මහජනතාවට ප්‍රකාශ කරනු ලැබූ අතර, ඒ බව 1995 ජූලි මස 25 වෙනි දින ඩේලිනිවුස් පත්‍රයේ පළ කර තිබුනේ මෙසේය:

President issues directive as finance minister

# Hilton finale once SPC decides

President Chandrika Kumaratunga, in her capacity of finance minister, has directed that no implementation of any aspect of the Hilton settlement should take place, until all the relevant issues are fully canvassed and decided upon by the special presidential commission which is inquiring into the Hilton case.

"The government's commitment to transparency is deep and unequivocal. It is of the greatest importance to us that no irrevocable step should be taken until the controversies, which are involved in current judicial proceedings, are resolved.

In particular, the president's directive is that, with immediate effect, no payment which is contemplated by the settlement will be made, nor will any other aspect of the settlement be implemented in any way, until the conclusion of the inquiry by the special presidential commission into the Hilton case", Justice and Constitutional Affairs and Deputy Finance Minister G.L. Peiris said.

He said that neither the minister nor the deputy minister of finance participated in any manner in the negotiations which preceded this settlement.

Neither of them had at any time met any agent or representative of Mitsui or Taisei, directly or indirectly, for the purpose of any discussion whatsoever, with regard to the settlement. They are both eager that all the relevant issues should be fully examined before the settlement is given effect.

Prof. Peiris said there had been a variety of questions raised about the settlement in the Hilton case. There had also been judicial intervention, in the form of injunctions and other orders, in litigation which has commenced during the last few days.

ඉහත දැක්වෙන පුවත්පත් වාර්තාවේ සිංහල පරිවර්තනය මෙසේය:-

*මුදල් අමාත්‍යවරිය ලෙස ජනාධිපතිනිය විධානය කරයි*

*හිල්ටන් හෝටලය පිළිබඳ අවසාන තීරණය විශේෂ ජනාධිපති කොමිෂමේ තීරණයෙන් පසුව*

*හිල්ටන් හෝටලය පිළිබඳ කාරණය විභාග කරන විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් අදාල සියලු ප්‍රශ්න සම්පූර්ණයෙන් ම පරීක්ෂා කර බලා තීරණය කරන තෙක්, හිල්ටන් හෝටලය පිළිබඳ සමථයේ කිසිදු කොටසක් ක්‍රියාත්මක නොකළ යුතු බවට මුදල් අමාත්‍යවරිය වශයෙන් චන්ද්‍රිකාකුමාරතුංග ජනාධිපතිනිය විසින් විධාන කර ඇත.*

*ප්‍රත්‍යක්ෂතාවයට රජය කැපවීම ඉතා ගැඹුරු හා ඒකාන්ත එකකි. වත්මන් අධිකරණමය ක්‍රියා දාමයට අදාල වී ඇති ප්‍රතිවිරෝධතාවයවයන් විසඳා ගන්නා තෙක් වෙනස් කල නොහැකි පියවර ගැනීමෙන් අප වැලකී සිටීම අතිශයින්ම වැදගත්*

*කරුණකි. විශේෂයෙන්ම, ජනාධිපතිතියගේ නියෝගය නම්, සමථය විසින් අදහස් කොට ඇති ගෙවීම් වහාම ක්‍රියාත්මක වන පරිදි නැවැත්විය යුතු බවත්, හිල්ටන් හෝටලයේ කාරණය පිලිබඳව විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් පරීක්‍ෂා කර බලා අවසන් කරන තෙක් සමථයේ අතිකුත් කාරණා ද කවර හෝ අන්දමකින් ක්‍රියාත්මක කිරීම නො කලයුතු බවය. මේ බව අධිකරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති සහ නියෝජ්‍ය මුදල් ඇමති ජී. එල්. පීරිස් මහතා විසින් පවසන ලදී.*

*මෙම සමථය ඇති කර ගැනීමට පෙරාතුව පැවැති සාකච්ඡාවලට මුදල් ඇමතිවරයා හෝ නියෝජ්‍ය මුදල් ඇමතිවරයා කවර වූ හෝ ආකාරයකින් සහභාගී වී නැති බව ඔහු කියා සිටියේය. සමථය සම්බන්ධයෙන් වූ කවරාකාර වූ හෝ කිසිදු සාකච්ඡාවක කාර්යයක් සඳහා කෙලින්ම හෝ අන්‍යාකාරයෙන් මිට්සුයි හෝ තායිසේ සමාගම්වල යම් අනුයෝජිතයෙක් හෝ නියෝජිතයෙක් ඔවුන් දෙදෙනාගෙන් කිසිවකුට කවර හෝ අවස්ථාවක මුණ ගැසී නොමැති බවද ඔහු කියා සිටියේය. සමථය ක්‍රියාත්මක කිරීමට කලින් මේ සම්බන්ධයෙන් වූ සියළු අදාල ප්‍රශ්න පූර්ණ ලෙස පරීක්‍ෂා කර බැලීමට දෙදෙනාම ඉතා ඕනෑකමින් සිටිති.*

*හිල්ටන් හෝටලයේ කාරණය සම්බන්ධයෙන් ඇති කරගත් සමථය ගැන නගන ලද විවිධාකාර වූ ප්‍රශ්න රාශියක් තිබෙන බව මහාචාර්ය පීරිස් විසින් පවසන ලදී. තවද පසුගිය දින කීපය තල දී ආරම්භ කරන ලද නඩු කටයුතුවල දී සඳහන් කරනු ලැබූ ඉන්ජන්ෂන් සහ වෙනත් නියෝගවල ආකාරයෙන් වූ අධිකරණමය මැදිහත්වීම් ද තිබෙන බව ඔහු විසින් කියා සිටින ලදී."*

*එකී ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවේ සත්‍ය පිටපතක් "පී3" වශයෙන් ලකුණු කොට මෙයට අමුණනු ලබන අතර, එය මෙහිම කොටසක් ලෙස සලකණ මෙන් අයැද සිටිනු ලැබේ.*

18. විත්තිකරුගේ ඉහත කී ප්‍රකාශය ද්වේශ සහගත බවද, එහි අසත්‍ය කරුණු අන්තර්ගත බව ද පැමිණිලිකරු කියා සිටී. තවද එය පල කරනු ලැබ ඇත්තේ පැමිණිලිකරු ගැන සහ සම්බන්ධව බවත්, එයින් අවබෝධ වූයේ සහ අවබෝධ කිරීමට අදහස් කලේ පැමිණිලිකරු ගැන කෙරෙන සඳහනක් බවත්, එය එනයින්ම සහ වක්‍රෝක්තියෙන් ද පැමිණිලිකරු සම්බන්ධයෙන් අපකීර්තිකර බවත් පැමිණිලිකරු කියා සිටී, ඒ කෙසේද යත්:

(අ) මෙහි ඉහත වඩාත් සම්පූර්ණ ලෙස දක්වා ඇති කරුණු තිබෙන හැටියට, පැමිණිලිකරුගේ තනි උත්සාහයත් හේතුනොටගෙන පහත සඳහන් කාරණයන්ට පැමිණිලිකරු හේතු සාධක වූ බව සියලු වැදගත් කාලයන්හිදිම, මහජනයා දැන සිටියෝය,

(i) කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ නඩුව පැවරීමෙන් මිට්සුයි සහ තායිසෙයි සමාගම් වලට ගෙවීම් කිරීම ඉන්ජන්ෂන් නියෝග මගින් තහනම් කිරීම,

(ii) සන්නිවේදන මාධ්‍යය විසින් සහ මහජනතාව විසින් ද *"හිල්ටන් ප්‍රෝඩාව"* යනුවෙන් විස්තර කිරීමට යෙදුණා වූ ද, 1994 මහා මැතිවරණයට පෙරාතුවම වූ කාලය තුල දී පොදු පෙරමුණ විසින් ස්වකීය ප්‍රධානතම ප්‍රචාරක අවිවලින් එකක් ලෙස භාවිතා කිරීමට යෙදුනා වූ ද, එසේම, වෙනත් දේ අතර, ඉහත කී විශේෂ ජනාධිපති කොමිෂම පිහිටුවීමට තුඩු දුන්නා වූ ද සිද්ධි එකී නඩුවෙහි ගොනු කල උපධානයන් මගින් හෙළිදරව් කිරීම,

(iii) 1992 වසරේ දී පසුගිය රජයේ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ආරාධනය පිට, මෙහි මින් ඉහත දක්වා ඇති පරිදි එකී ජපන් සමාගම් සමග සමථයකට එළඹීම පිණිස සාකච්ඡාවල ප්‍රමුඛත්වය ගැනීම.

(iv) වත්මන් රජය විසින් කරන ලද ආරාධනය පිට සහ මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු ලෙස ධූරය භාර ගැනීමෙන් අණතුරුව, මෙහි මින් ඉහත දක්වා ඇති පරිදි, එකී ජපන් සමාගම් සමග සමථයට එළඹීමේ සාකච්ඡා වත්මන් රජය වෙනුවෙන් නැවත ආරම්භ කිරීම: සහ

(v) මෙහි මින් ඉහත වැඩිමනත්ව සඳහන් කිරීමට යෙදුණු සමථය ඇති කිරීම

(ආ) විත්තිකරු විසින් මහජනයාට කරන ලද සහ ඉහත කී පරිදි, වාර්තා කර තිබූ ප්‍රකාශයේ අඩංගු වී තිබුණ වචනවලින් විත්තිකරු පහත සඳහන් පරිදි අදහස් කළ අතර, අදහස් කළ බවට අවබෝධ කරන ලදී:-

(i) පැමිණිලිකරු විසින් ඇති කරන ලද සමථය පරාදෘශ්‍ය නොවන බව සහ වංක වූවක් බව,

(ii) පැමිණිලිකරුගේ ක්‍රියා කලාපය, රජයේ ගැඹුරු සහ නො අනුමාන පරාදෘශ්‍ය කැපවීම වෙනස් තළ නොහැකි සේ බාල්දු කර ඇති බව,

(iii) මිට්සුයි හා තායිසේයි සමාගම් සමග පැමිණිලිකරු විසින් සාකච්ඡා පවත්වන ලද්දේ තමාගේම උවමනාවෙන් බව සහ කෙළින් ම හෝ අන්‍යාකාරයකින් මුදල් අමාත්‍යවරයා සහ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා ඒ සම්බන්ධයෙන් එනම් සමථය සම්බන්ධයෙන් කිසිවක් නොදැන අන්ධකාරයේ පසු වූනු බව ද ඒ අනුව ඔවුන් කාරණයෙන් ඈත් වී සිටි බව,

(iv) සමථය ඇති කර ගැනීමෙදි පැමිණිලිකරු, මුදල් අමාත්‍යාංශයේ උපදේශකයකු වශයෙන් සිය ධූරය වැරදි ලෙස භාවිතා කර සහ අනිසි ලෙස යොදා ගෙන ඇති බව,

(v) පැමිණිලිකරු විසින් කටයුතු සමාප්ත කරන ලද සමථය පිළිබඳව විවිධාකාර වූ ප්‍රශ්න මතු කර ඇති බවත් ඒවා අල්ලස් සහ දූෂණ පිළිබඳ විශේෂ ජනාධිපති කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බැලීම උචිත බව:

(vi) පැමිණිලිකරු විසින් කටයුතු සමාප්ත කරන ලද සමථය ක්‍රියාත්මක කිරීමට පෙරාතුව ප්‍රශ්න ගනනාවක් පූර්ණ ලෙස පරීක්ෂා කිරීමට ඇති බව.

(vii) වහාම ක්‍රියාත්මක වන පරිදි, පැමිනිලිකරු විසින් සමාප්ත කරන ලද සමථය ප්‍රකාරව නියමිත කිසිඳු ගෙවීමක් නො කරනු ලබන බව ද සමථයේ කිසිදු හෝ අංගයක් ක්‍රියාත්මක නොකරනු ලබන බව,

(viii) පැමිණිලිකරු විසින් සමථයේ සාකච්ඡා රහසේ සහ පුද්ගලික ලාභ ප්‍රයෝජන සඳහා පවත්වා ඇති බව සහ ඒවා අධිකරණමය ක්‍රියාවලිය මගින් පරීක්ෂා කරගෙන යන බව සහ/හෝ වැරදි භාවිතය සඳහා සහ/හෝ ප්‍රෝඩාව සඳහා සහ/හෝ දූෂණය සඳහා පරීක්ෂා කර බැලීමට නියමව තිබෙන බව.

19.(අ) මෙම කාරණා හේතුකොටගෙන,පැමිණිලිකරුගේ සම්භාවනීයත්වයට හා කීර්තියට හානි වී ඇති බවත්, එමගින් ඔහු මහජන ගර්හාවට, පිළිකුලට හා අපහාසයට භාජනය කරනු ලැබ ඇති බවත්, පැමිණිලිකරු ප්‍රකාශ කර සිටී.

(ආ) විත්තිකරු විසින් එකී වචන පළ කර සිටියේ පැමිණිලිකරු කෙරෙහි වූ අනර්ථකාමීව සහ/හෝ වෛරයෙන් බව පැමිණිලිකරු කියා සිටී.

20.(අ) එදිනට ඉක්බිතිවම පූර්වයෙන් වූ දිනයේදී නගන ලද ප්‍රශ්නයකට උත්තර දෙමින් 1995 අගෝස්තු 8 වන දින වත්තිකරු විසින් පාර්ලිමේන්තුවේ දී දීර්ඝ ප්‍රකාශයක් කරන ලද අතර, ඒ ප්‍රකාශය වෙනත් පුවත්පත් අතර, 1995 අගෝස්තු 9වන දින ඩේලිනිවුස් පත්‍රයේ සහ "ද අයිලන්ඩ්" පත්‍රයේ වාර්තා කර තිබුණේය. ඒ ප්‍රකාශයෙන්, එකී සමථය මගින්, රජයට පිළිගත නො හැකි බැඳීම් ගණනාවකට රජය පාවා දී ඇති නිසා ඒ සමථය අත්හිට වූ බව කියා සිටි නමුත්, වත්තිකරු එහි සඳහන් කලේ එවැනි ඊනියා බැඳීම් එකක් පමණය. ඒ බැඳීම විශේෂයෙන්ම පැමිණිලිකරුට අදාළව කරන ලද එකක් වූ අතර, පද සම්බන්ධතාවයෙන් බැහැර ව, දන දනම, චේතනාන්විතව සහ හිතාමතාම, ඒ ඡේදයේ පළමු වන කොටස සහ පසුව එන කොටස අතහැර දමා මැද කොටස පමණක් සඳහන් කළ ප්‍රකාශයකි. එසේ කර ඇත්තේ පැමිණිලිකරුට දැඩි ලෙස අහිතකර වූ ද, හානිකර වූ ද පැමිණිලිකරු පිළිබඳ සාවද්‍ය ප්‍රතිරූපයක් හිතාමතාම සහ ඕනෑකමින් ම පිළිබිඹු කිරීම පිණිසය.

*එකී ප්‍රවෘත්ති පත්‍ර වාර්තාවල සහ සමථ ගිවිසුමේ එකී ඡේදයේ සම්පූර්ණ කොටස පිළිවෙලින් 'ඒ4ඒ, "ඒ4බී" සහ "ඒ5" වශයෙන් ද පද සම්බන්ධතාවයෙන් බැහැරව සඳහන් කර ඇති කොටස යටින් ඉරි ඇඳ "ඒ5ඒ" වශයෙන් ද ලකුණු කොට මේ සමග අමුණන අතර ඒවා මෙහි ම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ. රජය සහ පැමිණිලිකරු අතර වූ ගිවිසුමේ ඇමුණුමක් වන "ඒ5" දරන ලේඛණය, එච්ඩීඑල් සමාගම, එකී ජපන් සමාගමේ සහ පැමිණිලිකරු ද අතර වූ අංක 4 දරන ගිවිසුමේ ද ඇමුණුමක් වන අතර, එය "ඒ5බී"වශයෙන් ලකුනු කොට මෙයට අමුණා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.*

(ආ) එකී සමථ ගිවිසුමේ කොන්දේසිවලින් එක් කොන්දේසියක් තමාට පුද්ගලිකව ම බලපාන්නේය යන කරුණ යටපත් කරමින් අතිකුත් පිළිගත නො හැකි ඊනියා බැඳීම් කවරේ ද යන්න වත්තිකරු විසින් හෙළිදරව් නො කරන ලද්දේ ඔහු මෙකී කොන්දේසිවලින් බෙහෙවින් ම බලපෑ සහ සම්බන්ධතාවක් ඇති තැනැත්තකු නිසාය.

(ඇ) එකී සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම සම්බන්ධයෙන් මැදහත් වූයේ සහ එසේ කිරීමට සැලස්වන ලද්දේ තමා ම බව එකී ප්‍රකාශයෙහි වත්තිකරු විසින් ඒකාන්ත ලෙසින් ම පිළිගෙන ඇති අතර, ඒ බව කියා පා ඇත.

21. පාර්ලිමේන්තුවේ දී අනතුරුව අසන ලද තවත් ප්‍රශ්නයකට 1995 සැප්තැම්ර් 19වන දින වත්තිකරු විසින් දෙන ලද පිළිතුර ද 1995 සැප්තැම්බර් 20 වන දින ඩේලිනිවුස් සහ අයිලන්ඩ් පුවත්පත්වල වාර්තා කර තිබිණ. එම උත්තරය මගින් ද පැමිණිලිකරුට අතිශයින් ම අහිතකර වූද හානිදායක වූ ද සාවද්‍ය ප්‍රතිරූපයක් හිතාමතා ම සහ ඕනෑකමින් ම පිළිබිඹු කිරීමට යෙදී ඇත. සාමාන්‍ය සම්ප්‍රදාය, පරිචය හා කාර්ය පටිපාටියට අනුකූල ව නිවැරදි කරුණු දක්වමින් මුදල් ඇමතිනියගේ උපදෙස් පිට එවකට සිටි මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළියෙල කරනු ලැබුවා වූ ද මුදල් අමාත්‍යවරයාගේ මාර්ගයෙන් වත්තිකරු වෙත ඉදිරිපත් කරනු ලැබුවා වූද 1995 සැප්තැම්බර් 18 වන දින දරන නිල වශයෙන් සකස් කළ පිළිතුර වත්තිකරු විසින්, මේ අයුරින් ඉවත දමා ඇත.

*එකී පුවත්පත් වාර්තාවල සහ මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පිළියෙල කරන ලද 1995 සැප්තැම්බර් 18 වන දින දරන එකී නිල වශයෙන් සකස් කල පිළිතුරේ සත්‍ය පිටපත් පිළිවෙලින් "ඒ6ඒ", "ඒ6බී" සහ "ඒ7" වශයෙන් ලකුණු කොට මෙයට අමුණා ඇති අතර ඒවා මෙහිම කොටසක් ලෙස සලකන මෙන් අයැද සිටිනු ලැබේ.*

22. පෙත්සම්කරු විසින් 1985 අගෝස්තු 8 වන දින සහ 1995 සැප්තැම්බර් 19 වන දින කරන ලද ඉහත කී ප්‍රකාශවලට අදාළ ව සත්‍ය හා නිවැරදි කරුණු හෙළිදරව් කරමින් සහ එකී ප්‍රකාශ අසත්‍ය බව ඔප්පු කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය රාජිත සේනාරත්න මහතා විසින් 1995 දෙසැම්බර් 15 වන දින පාර්ලිමේන්තුවේ දී සම්පූර්ණ විස්තර සහිත ප්‍රකාශයක් කරන ලදී. පෙත්සම්කරු ඒ ප්‍රකාශයට ප්‍රතිවිරුද්ධව කිසිවක් නො කියා ම, 1995 දෙසැම්බර් 19 වන හුදෙක් මෙසේ ප්‍රකාශ කර සිටියේය: "*වෛද්‍ය රාජිත සේනාරත්න මහතා විසින් මගේ පුද්ගලික අවංකභාවය ගැන මට පහරක් එල්ල කර ඇත. ඒට පිළිතුරක් දීම මාර්ගයෙන් ඔහුගේ ඒ පහර දීම උදාරත්වයට පත් කිරීමට මම අදහස් නො කරමි.*" පාර්ලිමේන්තුවේ දී පෙත්සම්කරුගෙන් අසන ලද අතිකුත් ප්‍රශ්නවලට ද පෙත්සම්කරු විසින් උත්තර නො දී පසෙක තබා ඇත.

*වෛද්‍ය රාජිත සේනාරත්න විසින් 1995 දෙසැම්බර් 15 දින කරන ලද එකී ප්‍රකාශයේ සත්‍ය පිටපතක් "පී8" ලකුණු කර මෙම පැමිණිල්ලට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටසක් වශයෙන් දක්වා සිටියි.*

23.(අ) ඒට ප්‍රතිවිරුද්ධ සහ ඉහත සඳහන් කරන ලද ක්‍රියාකලාපයට හාත්පසින් ම විරුද්ධව, 1995 දෙසැම්බර් 19 වන දින පාර්ලිමේන්තුවේ දී පෙත්සම්කරු විසින් එච්ඩීඑල් සමාගමේ විගණකවරුන් වන පෝඩ් රෝඩ්ස් තෝර්න්ටන් සහ සමාගමේ ක්‍රියාකලාපයේ නිරවද්‍යතාවය රැක ගැනීමට ප්‍රබල උත්සාහයක් දරන ලදී. කොළඹ දිසා අධිකරණයේ අංක 3155/විශේෂ දරන නඩුවේ දී හෙළිදරව් කරන ලද කරුණු තිබියදීත් සහ නිකුත් කරන ලද වාරණ නියෝග වලංගුව තිබියදීත් එච්ඩීඑල් සමාගමේ ගිණුම් විගණනය කිරීමේ ඔවුනගේ ක්‍රියා කලාපය නිවැරදි කිරීමේ උත්සාහයක පෙත්සම්කරු නිරත විය. එකී විගණකවරුන් විසින්, නත් කාරණය ගැන පැමිණිලිකරුගේ විරෝධතා ගණන් නො ගෙන, 1990 මාර්තු 31 වන දිනයෙන් අවසන් වන වර්ෂයේ එච්ඩීඑල් සමාගමේ වාර්ෂික ගිණුම් අත්සන් කර/සහතික කර ඇත. එසේ සහතික කිරීමට කලින්, පැමිණිලිකරුගේ ඉල්ලීම පිට, එච්ඩීඑල් සමාගම විසින් විශේෂයෙන් නියම කරනු ලැබූ ඇතැම් විභාග කිරීම් සහ වාර්තා කිරීම් සිදු කිරීම පැහැර හැර සහ අතපසු කර ඇත.

(ආ) යථෝක්ත අවස්ථාගත කරුණු නිසා, 1990 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂයේ එකී විගණනය කළ වාර්ෂික ගිණුම් පිළි ගැනීමෙන් වාරණය කිරීම සඳහා එච්ඩීඑල් සමාගමේ අයිතිය පරිදි සහ ඒ වෙනුවෙන් තවදුරටත්වූ, නීති කෘත්‍යයක් එනම්, කොළඹ දිසා අධිකරණයේ අංක 3231/විශේෂ දරන නඩුව 1991 ජනවාරි යේ දී පැවරීමට පැමිණිලිකරුට අනිවාර්යයෙන් ම සිදු විය. අධිකරණය විසින් ඒ අනුව වාරණය කරනු ලැබිය.

(ඇ) සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන් පෙත්සම්කරු මෙම කරුණු ඉතා හොඳින් දැන ගෙන සිටියේය.

(ඈ) කොළඹ දිසා අධිකරණයේ අංක 3231/විශේෂ දරන එකී නඩුවේදී දිසා අධිකරණය විසින් එච්ඩීඑල් සමාගමේ විගණනකරුවන් වූ එකී පෝඩ් රෝඩ්ස් තෝර්න්ටන් සහ සමාගමේ හවුල්කරුවන්, පෙත්සම්කරුවන් ලෙස එකතු නො කළ යුත්තේ මන්දයි නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස එකී විගණනකරුවන් වෙත 1994 පෙබරවාරි මාසයේ දී නොතීසි නිකුත් කරන ලදී.

(ඉ) ඉහත 12 ඡේදයෙහි සඳහන් කරනු ලැබූ එච්ඩීඑල් සමාගමේ අධ්‍යක්ෂවරයන් වෙත විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් නිදහසට කරුණු ඉදිරිපත් කරන ලෙස නිකුත් කරන ලද නොතිසියේ දැක්වෙන චෝදනාවලින් එකක් මෙසේය:

"අධ්‍යක්ෂ මණ්ඩලයේ දැන ගැනීමට සලස්වන ලද විෂමතා, අඩුපාඩු සහ අක්‍රමිකතා නො සලකා හැර ඇති අතර, එකී සමාගමේ 1990 මාර්තු 31 වන දින අවසන් වූ වර්ෂයට වාර්ෂික ගිණුම් නීත්‍යානුකූල ගිණුම් ලෙස අනුමත කිරීම පිණිස සාවද්‍ය උත්සාහයක් දරා ඇත. ඒ අනුව, ඉහත කී ප්‍රෝඩාකාරී ක්‍රියා සහ අත්හැරීම් යටපත් කිරීමේ අරමුණින් ගිණුම් පිළිගැනීම පිණිස ක්‍රියා කිරීමට වෑයමක් කර ඇත."

24.(අ) 1996 වර්ෂයේදී පැමිණිලිකරු විසින් සමාප්ත කරන ලද්දා වූ එකී සමථ ගිවිසුම් ක්‍රියාවේ යොදවන ලෙස අතිගරු ජනාධිපතිනිය විසින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියම කරන ලදී.

(ආ) නීතිපතිවරයා විසින් සකස් කර අවසන් කරන ලද පරිශිෂ්ඨයක් රජය, එකී ජපන් සමාගම් සහ පැමිණිලිකරු අතර සහ ඔවුන් විසින් ලියා අත්සන් කරන ලද අතර, ඒවා රජයේ අයිතිවාසිකම් ආරක්‍ෂා කිරීම පිණිස ප්‍රමාණවත් ආරක්‍ෂාවක් ඇති කිරීම සඳහා සහ පූර්වග කොන්දේසි ක්‍රියාත්මක කිරීම සහතික කිරීම පිණිස අත්සන් කරනලදී.

(ඇ) මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ නීතිපතිවරයාගේ නියමය පිට, පරිශිෂ්ඨය මගින් නියම කල පරිදි, එකී සමථ ගිවිසුම්වලින් ඉවත් කලයුතු එකම කොන්දේසිය වූයේ <u>විත්තිකරුත් ඇතුලත් වූ</u> සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ සාමාජිකයින්ට විරුද්ධව රජය විසින් ගැනීමට තිබූ ක්‍රියාවන්ට අදාල වූ කොන්දේසි ය ය. රජයට පිලිගත නොහැකි කොන්දේසි වශයෙන් වෙනත් කිසිඳු කොන්දේසියක් අතහැර දැමීමට නියමයක් නොවීය.

(ඈ) විත්තිකරු විසින් සිදු කරවන ලද නෛතික අත්හිටුවීම පිලිබඳ වූ වරද පිළි ගැනීම සම්බන්ධව කවර හෝ ප්‍රසිද්ධ මත ප්‍රකාශයකින් තොරව සංශෝධිත පැමිණිලිකරු විසින් ඇති කරවන ලද සමථය මුදල් අමාත්‍යාංශය විසින් පසුව ක්‍රියාවේ යොදවන ලදී.

(ඉ) විත්තිකරු විසින් සිදු කරන ලද අත්හිටුවීමෙන් පැමිණිලිකරු විසින් 1995 ජූනි 28 වන දින කටයුතු සමාප්ත කරන ලද සමථ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමෙහි ලා ඇති වූ ප්‍රමාදය හේතුකොටගෙන ගෙවීමට සිදුවන පොලිය වශයෙන්, රු. මිලියන 55කට ආසන්න අලාභයක් එච්ඩීඑල් සමාගමට විඳින්නට සිදු කර ඇත. එයින් සමථය යටතේ අදහස් කරන ලද මූල්‍ය ප්‍රතිව්‍යහකරණය ද අණතුරට ඇද දමා ඇති අතර, රාජ්‍ය ඇපවීම් යටතේ 1997 ජූලි මස 1වන දිනට එකී ජපන් සමාගම්වලට ගෙවීමට නියමිත ව තිබුණු මුදල් ගෙවීමට හැකි වනු පිණිස එච්ඩීඑල් සමාගමට රජය විසින් මුදල් අත්තිකාරම් කිරීමට ද සිදු විය.

25.(අ) මෙම පසුබිම අනුව, ඉහත කී පරිදි සිදු කලා වූ පාඩුව හා හානිය සම්බන්ධයෙන් සුදුසු පරිදි පාඩුව පිරිමසන ලෙසට පැමිණිලිකරු සිය නීතිඥ මගින් විත්තිකරුගෙන් ලිඛිතව ඉල්ලා සිටියේය. එහෙත් විත්තිකරු එසේ කිරීමට අපොහොසත් ව පැහැර හැර ඇත.

(ආ) පසුව, පැමිණිලිකරු සිය නීතිඥවරයා මගින්, තමන්ට සිදු වූ හානිය ලෙස සහ වශයෙන් රු:300,000,000.00 වන මුදලක් ගෙවන ලෙසට විත්තිකරුට නියම කර, ඉල්ලා සිටි අතර, විත්තිකරු එය ගෙවීම පැහැර හැර සහ අතපසු කර ඇත.

26. විත්තිකරු සිය නිල තත්ත්වයෙන් ක්‍රියා කරන බව අදහස් කර ඇති හෙයින් පැමිණිලිකරු විසින් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 461 වැනි වගන්තියට අනුකූලව සිය නීතිඥ මගින් 1997 ජූනි මස 19 දිනැති යොමු අංක ඇන්ඇස්ජ්/ජීඑල්පී/97-6 ලිපිය මගින් දැන්වීමක් .ඔහු අමතා යවන ලදී

*යොමු අංක: ඇන්ඇස්ජ්/එල්පී/97-6 දරන 1997 ජූනි 19 දිනැති එකී ලිපියේ සත්‍ය පිටපතක "ඒ9" වශයෙන් ලකුණු කර මෙම පැමිණිල්ලට අමුණා ඇති අතර, මෙහි අවශ්‍ය කොටසක් වශයෙන් දක්වා සිටී*

27. මෙම කරුණ නිසා පැමිනිලිකරු රු.300,000,000.00 වන මුදලකට සීමා කරන අලාභ හානි ලබා ගැනිම සඳහා විත්තිකරුට විරුද්ධව නඩු පැවරීම පිණිස පැමිණිලිකරුට නඩු නිමිත්තක් පැන නැගී ඇත.

එම නිසා පැමිණිලිකරු මෙම අධිකරණයෙන් ගෞරවයෙන් මෙසේ අයැද සිටින්නේ:-

(අ) රු.300,000,000.00 වන මුදලක් ද මෙම පැමිණිල්ලේ දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා ඒ මත නෛතික පොලිය ද ඉන් පසුව මුදල සම්පූර්ණයෙන් පියවා අවසන් වන තුරු තීන්දු ප්‍රකාශිත මුලු මුදල මත එම පොලී අනුපාතය බැගින් ම පොලිය ද අය කර ගැනීම සඳහා විත්තිකරුට විරුද්ධව නඩු තීන්දුවක් ලබා දෙන ලෙසත්,

(ආ) නඩු ගාස්තු ලබා දෙන ලෙසත්, සහ

(ඇ) මෙම අධිකරණයට මැනැවැයි පෙනී යන්නා වූ එවැනි වෙනත් සහ තවදුරටත් වූ සහන ලබා දෙන ලෙසත් ය.

පැමිණිලිකරුගේ නීතිඥ.

<u>පැමිණිල්ල සමග ගොනු කර ඇති ලේඛණ</u>

"ඒ1" සිට "ඒ9" දක්වා ලකුණු කර ඇති ලේඛණ.

පැමිණිලිකරුගේ නීතිඥ.